සැ. යු. — 2014.04.11 දින පළ වූ අංක 1,858 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,859 - 2014 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 602 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 612 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 09 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. ඩී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්, තාවකාලික, ආදේශක සේවකයින් ගැන වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක | 01 | PL1-2006A රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතිකපත්‍ර සා/පෙළ විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයන් 06 ක් සමත්විය යුතුය. |
| 10. | යන්ත්‍ර ක්‍රියාකරු | 01 | PL-2-2006A - රු.12,210 - 10 x130 - 10 x145- 10 x 160-12 x 170 - රු. 18,600 | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* අවම වශයෙන් 8 ශ්‍රේණිය 9 වසර සමත්වී තිබීම.<br><br>*බාහිර අයදුම්කරුවන් සඳහා* ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම<br><br>*වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*<br><br>(i) තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් හා මගීන් 32 ට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br><br>(ii) අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතු ය.<br><br>(iii) බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව, රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවිනතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br><br>(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය. |

02. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි
(iii) අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුයි.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් හා දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම ඃ*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2014.04.25 හෝ එදිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කර " ........................................... තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.

(iii) අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය ඃ-

*(අ)* උප්පැන්න සහතිකය ;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය ;
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය; (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතු ය.)
*(ඉ)* මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් ;
*(ඊ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. ආර්. පොතුවිල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 24 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාව,
අගලවත්ත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අගලවත්ත ප්‍රාදේශීය සභාව***

*අගලවත්ත ප්‍රාදේශීය සභාවේ........................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.
3. ස්ථිර ලිපිනය:————————————.
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:————————————.
5. දිස්ත්‍රික්කය:————————————.
6. උපන් දිනය ඃ අවුරුද්ද:————————————. මාසය:————————————. දිනය:————————————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2014.04.25) වයස ඃ අවුරුදු:——————. මාස:——————. දින:——————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.
9. විවාහක ද/අවිවාහක ද යන වග:————————————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග:————————————.
11. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.
12. අධ්‍යාපන සුදුසුකම්:————————————.
අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය:————————————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2 | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————.
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————.

එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද දනිමි.

————————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

........................................... මහතා/මහත්මිය මෙම ආයතනයේ ................................................ වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන

04-441

---

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවාගැනීම |
|---|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු III | 01 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. | PL-1-2006A 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | වාචික පරීක්ෂණය |
| 02. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. | PL-1-2006A 11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | වාචික පරීක්ෂණය |
| 03. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 06 සමත්වී තිබීම. මින් විෂයයන් පහක් එක් වරක දී සමත් වී තිබිය යුතුය. | PL-2 -2006A 12,210 - 10 x 130 - 10 x145 10 x 160 - 12 x 170 - රු. 18,600 | වාචික පරීක්ෂණය |

සහ

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවාගැනීම |
|---|---|---|---|---|---|
| | | | ආ. අදාල තනතුරේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කල යුතුය.) | | |
| 04. | සෞඛ්‍ය කම්කරු | 03 | අවම වශයෙන් 08 වසර/09 ශ්‍රේණිය සමත්ව සිටිය යුතුයි. | PL-1- 2006A රු. 11,730 - 10 x 120 - 10 x 130-10 x 145 - 12 x 160 - රු.17,600 | වාචික පරීක්ෂණය |
| 05. | සුළු පරිපාලක වැඩ/ක්ෂේත්‍ර | 01 | අ. සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/ විද්‍යාව ඇතුලුව යටත් පරිසෙයින් විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස. පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සමත්ව තිබීම ;<br>හෝ<br>ආ. සිංහල/දෙමළ සහ ගණිතය/ වාණිජ/අංක ගණිතය ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුලුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකු ; හෝ<br>ඇ. පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වැනි ශ්‍රේණියේ සාමාර්ථය ලබා තිබීම. | MN-1-2006A රු.13,120 - 10 x 145 - 11 x 170-10 x 240 - 10 x 320 - රු.22,040 | වාචික පරීක්ෂණය |
| 06. | සුළු පරිපාලක සෞඛ්‍ය | 01 | අ. සිංහල/දෙමළ සහ ගණිතය /අංක ගණිතය/වාණිජ අංක ගණිතය ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුලුව යටත් පිරිසෙන් විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අ.පො.ස. පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සමත්ව තිබීම ;<br>හෝ<br>ආ. සිංහල/දෙමළ සහ ගණිතය/වාණිජ/ අංක ගණිතය ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුලුව විෂයයන් 06 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකු;<br>හෝ<br>ඇ. පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 ශ්‍රේණියේ සාමාර්ථය ලබාතිබීම. | MN-1-2006A රු.13,120 - 10 x 145- 11 x 170-10 x 240 - 10 x 320 - රු.22,040 | වාචික පරීක්ෂණය |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවාගැනීම |
|---|---|---|---|---|---|
| 07. | මුරකරු | 01 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. | PL-1-2006A රු.11,730 - 10 x 120- 10 x 130 10 x 145 - 12 x 160 - රු.17,600 | වාචික පරීක්ෂණය |
| 08. | පුස්තකාල සහායක | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරක දී කවර හෝ විෂයයන් 06 කින් සමත් විය යුතුයි. | PL-1-2006A රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු.17,600 | වාචික පරීක්ෂණය |

01. *බඳවාගැනීමේ පොදු කොන්දේසි :-*

i. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි
ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුයි. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
iii. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුයි. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුයි)
iv. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
v. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.
vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.
vii. රජයේ හෝ පළාත් පාලන සේවයේ පහ කරනු නොලැබූ අයෙකු විය යුතුයි.
viii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුයි.
ix. දැනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ස්වේච්ඡා/ස්ථිර පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.
x. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේදී, මධ්‍යම පළාතේ මෙම තනතුරුවලට අදාලව නව බඳවාගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීමද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

02. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01 ක පරිවාස කාලයකට යටත් වේ.
ii. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුයි.
iii. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුයි.
iv. මෙම බඳවාගැනීම් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද/රජයේ මුදල් රෙගුලාසි වලට ද/රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද/මධ්‍යම පළාත් සභාව හෝ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

03. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලි වල ඡායාපිටපත් අමුණා එවිය යුතුයි :

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
iv. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
v. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (මින් 01 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතුය)
vi. පළපුරුද්ද පිළිබඳ සහතිකය
vii. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය

04. වෘත්තීය තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත ඇතුළත්, පහත සඳහන් පරිදි සකසා ගත් අයදුම්පතක් අදාල සියලුම සහතිකවල පිටපත් ද සමගින් 2014.04.30 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුයි.

05.අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

06.දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

*කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ.... තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. මුලකුරු සමග නම :——————————.
   (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර ලිපිනය:——————————.
3. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
6. දුරකථන අංකය:——————————.
7. විවාහක/අවිවාහක බව:——————————.
8. අධ්‍යාපන සුදුසුකම්:——————————.

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පංතිය සිංහල :——————————.දෙමළ:——————————.

8.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය:
(i) වර්ෂය:——————————. මාසය:——————————.
(ii) විභාග අංකය:——————————.
(iii) ප්‍රතිඵල :——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6 | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උ/පෙළ) විභාගය :—

(i) වර්ෂය :——————————. මාසය:——————————.
(ii) විභාග අංකය :——————————.
(iii) ප්‍රතිඵල :——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

9. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————.
10. වෙනත් සුදුසුකම් :——————————.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) මෙම ආයතනයේ............................. තනතුර දරන................................... මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

——————————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————————————.

04-497

---

**යටවත්ත ප්‍රාදේශීය සභාව**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ යටවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහායක III පන්තිය | 01 | පීඑල්- 1 2006A රු. 11,730 - 10 x 120 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 02 | මුරකරු (කා. සේ. සේ. II පංතිය) | 01 | 06/2006 (IV) -PL- 1- 12 වැනි පියවර රු.13,060-130 x 14 - රු.14,880 (හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. |
| 03 | විදුලි කාර්මික III පන්තිය | 01 | පී එල් -2- 2006A රු. 12,210 - 10 x 130 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>***ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :***<br><br>අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතු ය.<br><br>*(අ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වැනි මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම.<br><br>*හෝ*<br><br>(ආ) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DYET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br><br>*හෝ* |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSE) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම<br>හෝ<br>*(ඈ)* .ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br>හෝ<br>*(ඉ)* ජාතික ආධුනිතත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම<br>හෝ<br>*(ඊ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව, එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>*පළපුරුද්ද*<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02 ක් වත් විය යුතුය.) |
| 04 | සෞඛ්‍ය කම්කරු III වැනි පන්තිය | 02 | පීඑල්.1-2006A රු.11,730 - 10 x120 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,800 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණියට (09 වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 05. | රියැදුරු III පන්තිය | 01 | පීඑල්. 3 - 2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 - 160 12 x 170 - රු. 18,860 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයක්වත් සමත්වී තිබිය යුතුය. වෛකල්පිත විෂයයන් හැර)<br>*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා*<br>අදාල තනතුරට නියමිත කාර්මික නිපුණතාව පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතුය.<br>බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර නිපුණතා සහතිකයක් ලබා තිබිය යුතු තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වෘත්තීය ප්‍රවීණතා බල පත්‍රයක් ලබා සිටිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් සී සහ සී 1 වාහක පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)<br>*පළපුරුද්ද*<br>අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම යටත් පිරිසෙයින් අවුරුදු 03 ක වත් පළපුරුද්දක් තිබිය යුතුය. මෙම පලපුරුද්ද ලිඛිත ලියවිලි මගින් සනාථ කළ යුතු.ය. එය රජයේ හෝ ලියා පදිංචි පෞද්ගලික ආයතනයකින් ලබාගත් සහතිකයක් විය යුතු ය. |

*01. රියදුරු තනතුරට අදාල යෝග්‍යතා/සුදුසුකම් :-*

(අ) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.
(ආ) දිවා කාලය සහ රාත්‍රි කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
(ඇ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයෙකු විය යුතුය.
(ඈ) රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාධු ලේඛණයට නම ඇතුළත් නොවූ අයෙකු විය යුතුය.
(ඉ) රියදුරු තනතුර සඳහා බඳවා ගනු ලැබීමට දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙක්, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතුය.
(ඊ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
ii. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 3 ක කාලයක් යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
iii. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත. මෙම සහනය ලැබෙන්නේ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට පමණි.)
iv. දැනටමත් මෙම ආයතනයේ අනියම්/ආදේශක/තාවකාලික/කැලි පදනම මත සේවයේ නියුතු අයවලුන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.
v. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් සිටිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.
vi. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.
vii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය;
ii. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායකත්වය හිමි වේ;
iii. පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ;
iv. මෙම බඳවාගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද මධ්‍යම පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් (වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය)

04. *අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතිකය
iii. තම පදිංචිය සනාත කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
iv. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතු ය.)
v. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
06. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසු කම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම් කරනු ලැබේ.

07. *අයදුම්කළ යුතු ආකාරය :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2014.06.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, යටවත්ත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.(දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය යටවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ඩී. එම්. ලලිතා සෝමාවතී,
ලේකම්,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 02 වෙනි දින,
යටවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලය.

ආදර්ශ අයදුම්පත්‍රය

යටවත්ත ප්‍රාදේශීය සභාව

යටවත්ත ප්‍රාදේශීය සභාවේ ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
02. මුලකුරු සමග නම :——————————.
03. ස්ථිර ලිපිනය :——————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
05. උපන් දිනය ෘ වර්ෂය:——————————. මාසය:——————————.ෘ දිනය :——————————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු :——————————. මාස :——————————. දින :——————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
08. විවාහක/අවිවාහක බව :——————————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න)

අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————————.
සමත් වර්ෂය :——————————. විභාග අංකය :——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01.<br>02.<br>03.<br>04. | | 05.<br>06.<br>07.<br>08. | |

අ. පො. ස. (උ/පෙළ) විභාගය ෘ
සමත් වර්ෂය :——————————. විභාග අංකය :——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01.<br>02.<br>03.<br>04. | |

12. (i) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————.
(ii) වෘත්තීය සුදුසුකම් :——————————.
(iii) සේවා පළපුරුද්ද :——————————.
1. දැනට සේවය කරන ආයතනය :——————————.
2. දැනට දරන තනතුර :——————————.
3. එම තනතුරට පත් වූ දිනය :——————————.
4. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————.

13. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :——————————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක යන වග :——————————.
එම තනතුරට පත් වූ දිනය :——————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :——————————.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ෘ

............................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ...................................... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන

04-580

# පළාත් පාලන නිවේදන

**ගම්පහ මහා නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලා පනත 1987 අංක 38 දරන සමාජ ශාලා බලපත්‍ර ලබාදීමේ (සංශෝධිත පනත)

පහත නම් සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2014 වර්ෂයට බලපත්‍ර ලබාගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බැවි 1975 අංක 17 දරන සමාජ ශාලා පනත සහ 1987 අංක 38 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනතේ 6 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජශාලාව අසල පදිංචි යම් අයෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට සති හතරක් ඇතුලත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්,
ගම්පහ මහ නගර සභාව.

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජශාලාවේ ලේකම් ද, කළමනාකරු ද සභාපති ද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලා කටයුතු කරගෙන යෑමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|
| ජේ. විමල් ගමගේ මයා ශාන්ති පාර, ගම්පහ. | ලේකම් | ගම්පහ ක්‍රීඩා සමාජ ශාලාව | 15/2/1, මංගල පාර |

04-561

---

**අකුරණ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වගන්ති යටතේ කරන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් මාර්ගය අකුරණ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.


දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයක් විසින් යම් විරුද්ධතාවයක් පල කරනු ලබන්නේ නම් මෙම නිවේදනය දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තියේ ප්‍රකාරව ක්‍රියාකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

අලවතුගොඩ.,
අකුරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

*උපලේඛනය*

| *අනු අංකය* | *මාර්ගයේ නම* | *දිග* | *පළල* | *මායිම්* |
|---|---|---|---|---|
| 01 | දුනුවිල වත්ත උඩපාර | අඩි 960 | අඩි 08 | *වම් පස :-* එම්. කේ. වික්‍රමසිංහ මයාගේ ඉඩමෙන් ආරම්භ වී ඩී. එම්. කේ. ඩී. මුතුබණ්ඩා මයාගේ, පී. ජී. පන්තෝනිස් මයාගේ, එච්. එම්. එල්. අයි. හේනේ බංඩාර මයාගේ, එච්. ජී. කිරිබණ්ඩා මයාගේ, ඊ. ජී. ජයසිංහ මයාගේ ඉඩමට අයත්වන මායිම් වේ. *දකුණු පස :-* ඩී. ආර්. එම්. බණ්ඩාර මැණිකේ මියගෙන් ආරම්භ වී අජිත් වික්‍රමරත්න මහතාගේ ඉඩමට, එම්. කේ. ඩී. කොයින් මැණිකේ මියගේ ඉඩමට, ඩී. එම්. කේ. ඩී, කුඩා බණ්ඩා මයාගේ ඉඩමට අයත් වන මායිම් |


Licensed Surveyor & Leveller
No. 76 Nawahela Road
Kandy.
PLAN No. 973
Scale 4 Chains to One Inch
PLAN
of
Subdivisions of part of
Diminwila walla
situated at
Diminwila, Udagampaha Koule of Harispattu
Kandy District
CENTRAL PROVINCE.
Surveyed & Partitioned on 08th & 25th October 1987.
Uggalmawatta
State Land
Kandy
T. ATTANAYAKE

## බදුල්ල මහ නගර සභාව

මහ නගර සභා ආඥා පනතේ 159 වැනි වගන්තිය යටතේ වූ නිවේදනය (252 වැනි අධිකාරය)

252 වැනි අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 277(4) සහ 159 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙම නිවේදනය රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් දින සිට මෙහි පහත සඳහන් ප්‍රසිද්ධ වීදි සීමා ඇතුළත පදික වේදිකා මත තබා යම්කිසි ද්‍රව්‍යයක් විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම ම විසින් තහනම් කරනු ලබන බව, බදුල් ල මහ නගර සභාවේ නගරාධිපති උපාලි නිශ්ශංක ගුණසේකර වන මම මෙයින් නිවේදනය කරමි.

| | | |
|---|---|---|
| (1) | බසාර් වීදිය | ඔරලෝසු කණුව හන්දියේ සිට පහළ වීදියේ ඡේදන ලක්ෂ්‍ය දක්වා |
| (2) | පහල වීදිය | උතුරු පටු මාවත අතුරු සිඳෙන හන්දියේ සිට විහාරගොඩ වටරවුම දක්වා |
| (3) | දුම්රියපොල පාර | විහාරගොඩ වටරවුම සිට දුම්රිය ස්ථානය දක්වා |
| (4) | කණුපැලැල්ල පාර | බදුලු ඔය හරහා වැටී ඇති පාලම ළඟ දුම්රිය ස්ථානයට හැරෙන ස්ථානයේ සිට කණුපැලැල්ල පාර හා මයිලගස්තැන්න පාර (එළදළුව පාර) අතුරු සිඳෙන හන්දිය දක්වා. |
| (5) | බැංකුව පාර | විහාරගොඩ වටරවුම සිට බැංකුව පාර හා පහළ රජවීදිය අතුරු සිඳෙන හන්දිය දක්වා |
| (6) | තැපැල් කාර්යාලය පාර | රජවීදිය අතුරු සිඳෙන හන්දිය සිට පහළ වීදිය අතුරු සිඳෙන හන්දිය දක්වා |
| (7) | ධර්මදූත පාර | පහළ වීදිය අතුරු සිඳෙන හන්දියේ සිට රේස්කෝස් පාර අතුරු සිඳෙන හන්දිය දක්වා |
| (8) | දකුණු පටු මාවත | රජවීදිය අතුරු සිඳෙන හන්දියේ සිට පහළ වීදිය අතුරු සිඳෙන හන්දිය දක්වා |
| (9) | මහියංගන පාර | මහියංගන පාර, මැදපතන පාර අතුරු සිඳෙන හන්දිය දක්වා |
| (10) | චිකිත්සාගාරය පාර | රජ වීදිය බදුලු තානායම ඉදිරිපිට අතුරු සිඳෙන ස්ථානය (හරස් මාර්ගය) සිට කැඳල ඇල දක්වා |
| (11) | බ/වෙල පාර | බදුලු තානායම අසළ වටරවුම සහ රජවීදිය අතුරු සිඳෙන හන්දියේ සිට නඩුකාරකන්ද පාර අතුරු සිඳෙන හන්දිය දක්වා. |
| (12) | රජ වීදිය | බණ්ඩාරවෙල පාර වටරවුම/(බදුලු තානායම අසළ) සිට රජ වීදියේ ඔර්ලෝසු කණුව දෙපැත්තේ පටු මාවත් දෙක, පහළ රජ වීදිය හා උදයරාජ මාවත ආරම්භක අතුරු සිඳෙන හන්දිය දක්වා. |
| (13) | පස්සර පාර | විහාරගොඩ වටරවුම සිට මුතියංගන අලුත් ඇල පාර හා ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ අතුරු සිඳෙන හන්දිය දක්වා. |
| (14) | කැප්පෙටිපොළ පාර | වෙළේකඩේ කඩ වීදිය දෙපස සිට මහ විද්‍යාලය අසල අලුත් ඇල පාර අතුරු සිඳෙන ස්ථානය දක්වා. |

මෙම තහනම් නියෝගය කඩකරන යම් කිසිවෙකු මහෙස්ත්‍රාත් අධිකරණයේදී රුපියල් දෙසීයක දඩයකට යටත්වනු ලැබේ. මෙම කරුණු පිළිබඳව 1974.01.31 වැනි දින නිවේදනය මෙයින් අවලංගු කරමි. ඉදිරි වර්ෂ සඳහා ද මෙම නිවේදනය බල පැවැත්වේ.

නීතිඥ උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
බදුල්ල.

2014 මාර්තු මස ............................ වන දින දීය.

බදුල්ල මහා නගර සභා කාර්යාලය,
බදුල්ල නගරය,
බදුල්ල,

04-434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.